# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 ජූනි මස 04 වන දින පෙ.ව 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්විම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. ශෝක ප්‍රකාශ යෝජනා

**01. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එම්. සුජිත් කුමාර් දේශප්‍රිය කුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත ශෝකය පළ කිරීමේ යෝජනාව**

" බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට, දෙවන පළාත් සභාවට හා තෙවන පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර පහළොවක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එම් සුජිත් කුමාර් දේශප්‍රිය කුරේ මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. "

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

**02. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රිනී ජී.ඩී සිරිමතී මැතිණියගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත ශෝකය පළ කිරීමේ යෝජනාව**

“ බස්නාහිර පළාතේ පළාත් සභාවේ තෙවන පළාත් සභාවට පොදුජන එකසත් පෙරමුණ නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරියක වශයෙන් තේරී පත්ව වසර දෙකක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රිනී ජී.ඩී සිරිමතී මැතිණිය නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමියගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමියගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. ”

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

## X. පොදු කටයුතු

**01. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

### ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
### (කළුතර ප්‍රාදේශීය සභාව)

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - ***"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"*** නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 දරණ හා 2011.09.29 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන අතර,

එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

**02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් කරනු ලැබීමට**

**නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2වැනි වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

03. **ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**04. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

## (පානදුර නගර සභාව)

255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 157 (14 අ) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තිය යටතේ පානදුර නගර සභාව විසින් සාදන ලද පානදුර නගර සභාවේ - ***"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"*** නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු වූ 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1783/39 දරණ 2012 නොවැම්බර් මස 09 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන අතර,

එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 156 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

# XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා :**

*"නැණ ගුණ වැඩුම"* මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව යමින්, 2005 වසරේ සිට උපාධිධාරීන් සුවිශාල සංඛ්‍යාවකට බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ ගුරු පත්වීම් ලබා දීම කාගේත් ප්‍රශංසාවට ලක්වන්නකි.

විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් උපාධිලත් උපාධිධාරීන් වන මෙම ගුරුවරුන් විසින් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා ලබා දෙන දායකත්වය මෙම ගරු සභාව අගය කරන අතර, ඔවුන්ගේ වෘත්තිය නිපුනත්වය වර්ධනය කර ගනිමින් සේවා උසස්වීම් කරා යාමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට මංපෙත් විවෘත කළ යුතු යැයිද, එම ගුරුවරුන්හට උපාධියට හදාරන ලද විෂයයන්ම ඉගැන්වීමට අවශ්‍ය අවස්ථාව සලසා දී එමගින් වඩාත් තෘප්තිමත් ගුරු පරපුරක් බිහි කිරීමට හේතුවන පරිදි අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයිද බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි." **(යෝ/v(01)13/01)**

# XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.05.23 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda – 2013.05.23 docx